**ආලෙයියඩිවේම්පු ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 මැයි 29 දින සභාපතිවරයාට යවන ලදි.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ආලෙයියඩිවේම්පු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාහන 11 ක වටිනාකම රු.4,950,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල අදාල වාහනවල වටිනාකම් දැක්විය යුතු වේ. | තක්සේරු කිරීම නිමවූ පසු වාහනවල වටිනාකම ස්ථාවර වත්කම් යටතේ වාහන වෙනමම දැක්වීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,279,209ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,566,243 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,000,000 | 954,863 | 1,039,725 | 140,976 | 1,000,000 | 727,030 | 501,192 | 225,838 |
| කුලී | 4,320,000 | 4,511,770 | 4,497,615 | 620,246 | 2,500,000 | 3,100,398 | 3,018,125 | 623,591 |
| බලපත්‍ර ගාස්තු | 1,075,000 | 517,085 | 517,085 | 16,680 | 900,000 | 652,330 | 652,330 | 16,680 |
| වෙනත් ආදායම් | 14,416,000 | 12,012,781 | 10,732,831 | 5,865,300 | 14,541,000 | 9,121,158 | 4,535,808 | 4,585,350 |
| | **20,811,000** | **17,996,499** | **16,787,256** | **6,643,202** | **18,941,000** | **13,600,916** | **8,707,455** | **5,451,459** |

### 2.2.2 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මස් කඩ හිඟ බදුකුලී රු.761,222ක් අයකරගෙන නොතිබුණි. | නියමිත හිඟ මුදල් සම්බන්ධයෙන් නිසි පියවරගත යුතු වේ. | මෙම මුදල ලෙජර් ගිණුම්වලින් කපා හැරීමට නිර්දේශ කර ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා අම්පාර මාර්ගයෙන් පළාත්පාලන කොමසාරිස්වරයාට යවා ඇත. මේ සඳහා අනුමැතිය ලැබීමෙන් පසුව වැඩිදුර ක්‍රියාමාර්ග සභාව විසින් ගනු ලැබේ. |

### 2.2.3 ව්‍යාපාර බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සිනමා ශාලාවක් සහ නොතාරිස් කාර්යාල 05 ක් 2019 වර්ෂයේ සිට ව්‍යාපාර කටයුතුවල යෙදී තිබුණ ද, ප්‍රාදේශීය සභා පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී සිනමා ශාලා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. තවද, නොතාරිස් කාර්යාල ලියාපදිංචි කිරීමේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින අතර වාර්ෂිකව ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකෙරේ. එසේම 2020 වර්ෂයේ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකිරීමේදි 2019 වර්ෂයට අදාල හිඟ මුදලද අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.4 මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිශ්චල දේපල පැවරීමේදි නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තුමේන්තුවෙන් 2019 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉතා ඉක්මණින් මුද්දර ගාස්තු පිළිබඳ විස්තර ලබාගෙන නැගෙනහිර පළාත් භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කරනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ ප්‍රසිද්ධ මංමාවත් සහ ජනතාවගේ සුභ විචරණය, පිළිබඳ කාරණා සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් ඉටු කිරීම් පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් විධිමත් කිරීම ඇතුළු මූලික කරුණු 20 ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළයුතුව තිබුණත්, 2020 මැයි 28 දින දක්වා කරුණු 14 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි. | පනත අනුව අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළ යුතු වේ. | සභාව විසින් ඉදිරි කාලයේදි ආදායම් සහ විධිමත් කිරීම පිළිබඳව සකස් කළ යුතු අතුරු ව්‍යවස්ථා සභාව විසින් සකස් කර සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**(ආ) ක්‍රියාකාරි සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ඉටු කළයුතුව තිබුණු මූලික කාරණා වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස්කළ යුතු වේ. | ඉදිරි කාලයේදි සභාව විසින් ක්‍රියාකාරි සැලැස්මක් සකස්කර අවසන් ගිණුම් සමග අමුණනු ලැබේ. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 වර්ෂයේ රු.1,253,940 ක වියදමින් ඉදිකළ ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ මධ්‍යස්ථානය හා 2018 වර්ෂයේ මිලට ගත් රු.1,210,000 ක් වටිනා යන්ත්‍ර 02 භාවිතයට ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ මධ්‍යස්ථාන නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රදේශයේ මහජනයා අඛන්ඩව විරෝධය දක්වන නිසා සභාව විසින් මිලදී ගත් කාබනික පොහොර නිපදවීමේ යන්ත්‍රය සභාවේ අනුමැතිය සමග සුදුසු ප්‍රාදේශීය /නගර/මහා නගර සභාවකට ලබාදීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

(ඈ) තිරසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතින්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයම ක්‍රියා කළ යුතු වුවත් මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ඒවා ලඟා කරගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉලක්ක හඳුනාගෙන ඒවා ලඟා කර ගැනීමට සභාව විසින් කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදි මහජන සහභාගීත්වයෙන් සෑම බල ප්‍රදේශයක්ම ඇතුළත් වන පරිදි සකස් කරන ලද සංවර්ධන සැලැස්මට අනුව ඉදිරියේදී තිරසර සංවර්ධන ඉලක්ක සකස් කරනු ලැබේ. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ජල සම්බන්ධතාව ලබා දීම සඳහා පළුදු කරන ලද මාර්ග ප්‍රතිසංස්කරණය වෙනුවෙන් 114 දෙනෙකුගෙන් 2018 වර්ෂයේදී රු.233,100 ක් අයකර ගෙන තිබූ නමුත් පළුදු කළ මාර්ග නැවත ප්‍රතිසංස්කරණය කර නොතිබුණි. | පළුදු කළ මාර්ග පිළිසකර කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම කරුණ සම්බන්ධයෙන් සභාවේ තීරණයක් ගෙන අයවැය සැලැස්මෙන් අදාල පිළිසකර කිරීම් කටයුතු සඳහා ප්‍රතිපාදන සලසා ගනිමින් ඉතා ඉක්මණින් මාර්ගයේ පවතින වලවල් කාර්තුවකට හෝ අර්ධ වර්ෂයකට වරක් සභාව විසින් සම්පූර්ණයෙන්ම නැවත සකස්කිරීමට කටයුතු කරමි. |
| (ආ) | පළාත් නිෂ්චිත සංවර්ධන ප්‍රදාන වැඩසටහන 2017 යටතේ අලෙයාඩිවේම්පු සාගාමම් මාර්ගයේ සිට පනංකාඩු පාලම් ප්‍රදේශය දක්වා මීටර් 425 ක් දුරට පානීය ජලය බෙදාහැරීමේ ජලනල එළීම සඳහා රු.මිලියන 1.5 ක ප්‍රතිපාදන සලසා | අදාල කාර්යයන් සභාව විසින් නියමිත කාලය තුළ සිදු කළ යුතු වේ. | මෙම කරුණ පිළිබඳව වැඩි අවධානය යොමු කර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග සාකච්ඡා පවත්වා ගෙවා ඇති මුදලට ප්‍රමාණවත් පරිදි ජලනල එළීමේ ක්‍රියාවන් සිදු කිරීමට සභාව විසින් ක්‍රියාමර්ග ගනු ලැබේ. |

තිබුණි. සභාව විසින් මෙම වැඩසටහන සම්පූර්ණ කළ බවට ලේඛන සකස් කර 2018 ජනවාරි 19 දින ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් රු.1,498,183 ක් ලබාගෙන තිබුණි. එසේ වුවත් මෙයට අදාල කාර්යයන් 2020 මැයි 28 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අනුමත කළ සේවක සංඛ්‍යාව තුල පැවති තනතුරු 04 ක පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් අදාල දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කර තනතුරු පුරප්පාඩු පිරවීමට ක්‍රියා කරන බව දන්වා සිටිමි. |
| (ආ) 1991 වර්ෂයේ සිට මියගිය නිලධාරීන් 04 දෙනෙකුගේ ආපදා ණය හිඟ ශේෂය රු.65,069 ක් අයකර ගැනීමකින් තොරව පැවතුනි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල නිලධාරීන් 04දෙනා සම්බන්ධයෙන් ඇපකරුවන්ගේ විස්තර සහ ඔවුන්ගේ භාර්යාවන්, දරුවන් පිළිබඳ තොරතුරු හා ලේඛන ලබාගත නොහැකිව පවතින නිසා ඉදිරියේදි මෙම නිලධාරීන් සඳහා පාරිතෝෂික ලැබූ විටෙක ණය මුදල් අයකර නිරවුල් කිරීමට කටයුතු කෙරේ. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව සතු ස්ථාවර වත්කම්වල වටිනාකම් රු.199,667,204 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, චංචල සහ නිශ්චල වත්කම් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයන් පවත්වාගෙන යෑමට කටයුතු කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනයන් පවත්වාගෙන යාම සඳහා සියළුම තොරතුරු හා දත්ත දැනට සභාව විසින් රැස්කරමින් පවති. ඉදිරි කාලයේදි ස්ථාවර වත්කම් ලේඛනය සම්පූර්ණයෙන් සකස් කර සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් වෙන්වෙන් වශයෙන් සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 3.4.2 වාහන භාවිතය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වාහන 07 ක් වර්ෂ 04 කට වඩා අධික කාලයක සිට අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර ගාල්කර තිබුණි. | වාහන අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල වාහන කඩිනමින් අළුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | සභාව පරිහරණය කළ වාහන 10 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාව සතු වාහනවල අයිතිය පැවරීම සම්බන්ධ ලියවිලි මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. |